# බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
## பௌத்த மத அலுவல்கள் திணைக்களம்

"දහම්පාය", අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07.
"தஹம்பாய", இல 135, ஸ்ரீமத் அனகாரிக்க தர்மபால மாவத்தை, கொழும்பு 07.
"Dahampaya", No 135, Srimath Anagarika Dharmapala Mawatha, Colombo 07.

ප්‍රාදේශීය කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් ගොඩනැගිල්ල, මහනුවර.
பிராந்திய அலுவலகம், மாவட்ட செயலகக் கட்டிடம், கண்டி.
Regional Office, District Secretariat Building, Kandy.

ප්‍රාදේශීය කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් ගොඩනැගිල්ල, රත්නපුර.
பிராந்திய அலுவலகம், மாவட்ட செயலகக் கட்டிடம், இரத்தினபுரி.
Regional Office, District Secretariat Building, Ratnapura.


| මගේ අංකය. / எனது இல. / My No. | බෞ/කො/ද.පා/04/ගු.වි.2025 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2025/02/18 |
|---|---|---|---|---|---|

සියලුම දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන් වෙත

**<u>දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය - 2025, අයදුම්පත් කැඳවීම.</u>**

සදාචාර සම්පන්න දරු පරපුරක් සමාජයට දායාද කිරීම සඳහා නිශ්ශරණාධ්‍යාශයෙන් තම සේවය ලබාදෙන දහම් පාසල් ගුරුවරුන් අගය කිරීම, දැනුමෙන් සන්නද්ධ කිරීම , සමාජ පිළිගැනීමක් ලබාදීම හා ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා වාර්ෂිකව මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය මෙම වර්ෂයේ ද පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

02. ඒ අනුව අදාල විභාගය සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛය බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ (www.dba.gov.lk) නිල වෙබ් අඩවියෙන් හා Dhammaschool යෙදවුම (app ) මගින් ද .dbadhammaschool.blogspot.com යන දහම් පාසල් අංශයේ වෙබ් අඩවියෙන් ලබාගත හැකි අතර මේ සම්බන්ධයෙන් ඔබ දහම් පාසලේ සියලුම ගුරුවරුන් දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

03. විභාගය සඳහා අයදුම් කිරීමට මූලික සුදුසුකම් ලෙස බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි දහම් පාසලක 2025.03.01 දින වන විට මාස 06ක අඛණ්ඩ සේවා කාලයක් තිබීම හා 2024.09.01 දිනට වයස අවුරුදු 18ට සම්පූර්ණ වී තිබිය යුතුය.

04. එක් විභාග අපේක්ෂකයෙකු වෙනුවෙන් රජය විසින් විශාල පිරිවැයක් දරණ බැවින් **<u>ඉල්ලුම්පත් යොමු කරන සියළුම ගුරුවරුන් විභාගය සඳහා අනිවාර්යෙන් පෙනී සිටිය යුතුය.</u>** තවද විභාගය සඳහා ඉල්ලුම් කරන ගුරුවරුන්ගේ නාම ලේඛනයක් ප්‍රධානාචාර්ය විසින් තබා ගතයුතු අතර ඔවුන් සියලු දෙනාම විභාගය සඳහා යොමු කිරීම ප්‍රධානාචාර්යවරයාගේ ද වගකීම වේ. එසේම යම් විභාග අපේක්ෂකයෙකුට සාධාරණ හේතුවක් නිසා විභාගයට පෙනී සිටීමට නොහැකි වන්නේ නම් හෝ නොහැකි වූයේ නම් ඒ බව හේතු සහිතව ප්‍රධානාචාර්ය මගින් ලිඛිතව මා දැනුවත් කළ යුතුය.

05. මෙම විභාගය සඳහා අයදුම්පත් කැඳවීම මාර්ගගත ක්‍රමය ඔස්සේ 2025.02.20 දින සිට 2025.03.15 දින දක්වා සිදු කරන අතර පරිගණකයක්, ටැබ් යන්ත්‍රයක්, හෝ ස්මාර්ට් දුරකතනයක් භාවිතා කරමින් මාර්ගගත (On-line) ක්‍රමයට අයදුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමට පහසුකම් සලසා ඇත.

06. පහත සඳහන් ක්‍රමවේද මගින් අයදුම් පත්‍රය වෙත ප්‍රවේශ විය හැකි ය.

- බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ නිල (www.dba.gov.lk) වෙබ් අඩවියෙන්
- Dhammaschool යෙදවුම (app ) මගින්
- dbadhammaschool.blogspot.com වෙබ් අඩවියෙන්
- මෙම දැන්වීමේ ඇති QR කේතය ස්කෑන් කිරීමෙන්
- ඔබ ප්‍රදේශයේ බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරි අමතා ඔබේ දුරකතනයට What's app මාර්ගයෙන් ද link එක ලබාගත හැකිය.

ආර්.එම්.පී.රත්නායක
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්

පිටපත්

1. ගරු ප්‍රධාන ලේඛකාධිකාරි ස්වාමීන් වහන්සේ - සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය - ගරු ලේඛකාධිකාරි ස්වාමීන් වහන්සේලා දැනුවත් කිරීම සඳහා
2. සියලුම දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත - දැ.ගැ.ස හා අ.ක.ස
3. සියලුම දිස්ත්‍රික් / ප්‍රාදේශීය බෞද්ධ කටයුතු නිලධාරීන් වෙත - දහම් පාසල් දැනුවත් කිරීම සඳහා